# ශ්‍රී ලංකාවේ ආර්ථික දරිද්‍රතාව පිළිබඳ කෙරෙන විද්වත් විමසුම

■ ජනනී උඩබැද්දාව

දිළිඳු බව ගෝලීය සමාජය වෙලාගත් දරුණුතම ප්‍රශ්නයකි. මෙහි තීරණාත්මක සාධකය වන්නේ මිනිසාට ලැබිය යුතු මූලික අයිතීන් ක්‍රමිකව ගිලිහී යාමය. නමුත් ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ දිළිඳු බව තුරන් කිරීම එක් ප්‍රධාන අරමුණක් බව පුන පුනා කියවෙයි. ඒ අනුව 2025 වනවිට අන්ත දිළිඳුබව ලෝකයෙන් තුරන් කරන බවට ජාත්‍යන්තර තලයේ ඉලක්ක පවා සැකසී ඇත.



කෙසේ වෙතත්, දිළිඳුකම අවබෝධ කරගැනීම පිණිස හුදෙකලා ප්‍රවේශයක් නැත. එසේම එය ඇගයීම සඳහා තනි නිර්ණායකයක්ද නැත. මූල්‍යමය ප්‍රවේශය, ශක්‍යතා ප්‍රවේශය, සමාජ බහිෂ්කරණ ප්‍රවේශය සහ සහභාගීත්ව ප්‍රවේශය නම් වූ ප්‍රවේශ හතරක් ඔස්සේ දිළිඳු බව අර්ථ නිරූපණය කරනු ලබයි. "හොඳින් ජීවත්වීමේ අවස්ථාව පැහැදිලි ලෙස අහිමි වීම" යනුවෙන් ලෝක බැංකුව දරිද්‍රතාව අර්ථ දක්වනු ලබයි.

රටක දරිද්‍රතාව මනිනු ලබන්නේ 'දරිද්‍රතා ඉමක්' (Poverty line) යොදා ගැනීමෙනි. දරිද්‍රතා ඉමක් යනු පුද්ගලයකුට හෝ කුටුම්බයකට තම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට මසකට අවශ්‍ය කරන අවම මූර්ත ආදායම් ප්‍රමාණයයි. මෙය අවම ආහාර හා ආහාර නොවන පරිභෝජන අවශ්‍යතා මත තීරණය වන්නකි. පුද්ගලයකුගේ දෛනික පෝෂණ මට්ටම සඳහා අවශ්‍ය වන ආහාර ප්‍රමාණය පරිභෝජනය කිරීමට වැය වන මාසික වියදම ආහාර දරිද්‍රතා ඉමේ වටිනාකමයි. මුළු දරිද්‍රතා ඉම ගණනය කිරීමට ආහාර නොවන පාරිභෝජන වියදමත් සැලකිල්ලට ගනු ලැබේ. 2016 වනවිට ශ්‍රී ලංකාවේ දරිද්‍රතා දර්ශකය 4.1ක් ලෙස දැක්වේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 'ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයට' (Household Income and Expenditure Survey - HIES) අනුව එක් පුද්ගලයෙකුට තම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අවම වශයෙන් මාසිකව රු.4,166ක ආදායමක් අවශ්‍ය වේ.

3 වැනි ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටක් වූ ශ්‍රී ලංකාව වර්තමානයේ මධ්‍ය ආදායම් ලබන රටක් ලෙස නම් කරනු ලැබුවද, ලෝකයේ බොහෝ රටවලට මෙන්ම, ශ්‍රී ලාංකේය සමාජයටද දිළිඳු බව දරුණුතම ප්‍රශ්නයකි. මෙවැනි සන්දර්භයක ශ්‍රී ලංකාවේ දුගීභාවයට බලපාන හේතු පිළිබඳ විද්වතුන්ගේ අදහස් කිහිපයක් මෙසේ ගොනු කිරීමට 'අද ව්‍යාපාරික පිටුව' ඔස්සේ අප කටයුතු කළේ, මෙය යුගයේ අවශ්‍යතාවක් බව අවබෝධ කරගනිමිනි.

## 'සාර්ව හා සූක්ෂම කියලා සාධක ගණනාවක් හඳුනාගෙන තිබෙනවා'



**ආචාර්ය මාලක රණතිලක - ආර්ථික විද්‍යා අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

"සාර්ව හා සූක්ෂම කියලා සාධක ගණනාවක් හඳුනාගෙන තිබෙනවා. සූක්ෂම සාධක ලෙස හඳුනා ගැනෙන්නේ විශේෂයෙන් ආදායම, මානව සම්පත් ලබාගැනීමට තිබෙන හැකියාව, වගේම පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව, වත්කම් සහ භූගෝලීය පිහිටීම වැනි කාරණායි. සාර්ව සාධක යනු ආර්ථික වර්ධනය, ආංශික වර්ධනය, සේවා නියුක්තිය හා වියුක්තිය, උද්ධමනය, ගෙවුම් ශේෂය හා විශේෂයෙන් විනිමය අනුපාතිකය, රාජ්‍ය සුභසාධන වියදම් වගේ සාධකයි."

## 'ඉඩ ප්‍රස්ථා නොමැතිකම දරිද්‍රතාව සඳහා බලපාන ප්‍රධාන සාධකයයි'

පහසුකම් ඇතුළු සියලුම පහසුකම් සංකේන්ද්‍රණය වී තිබෙනවා. ග්‍රාමීය හා වතු අංශයේ පොදු පහසුකම්, යටිතල පහසුකම්වල ව්‍යාප්තිය ඉතාමත් අඩු මට්ටමක පවතිනවා. ජනතාවගේ ආදායම් උත්පාදනය සහ අනෙකුත් දරිද්‍රතාවට තුඩුදෙන සෞඛ්‍යය, අධ්‍යාපනය, නිවාස වැනි පහසුකම්වලට ප්‍රවිෂ්ට වීම සඳහා මෙවැනි වාතාවරණයක් හේතු වෙනවා.

ඒ වගේම, දරිද්‍රතාවේ චක්‍රීය ව්‍යාප්තියකුත් තිබෙනවා. මොකද සමහර විට දරිද්‍රතාවේ සිටින පවුල් ගත්තාම, ඒ පවුල් දිගින් දිගටම දරිද්‍රතාවේ ගැලිලා ඉන්න බවක් පේනවා. දෙමවුපියන්ගෙන් දරුවන්ට දරිද්‍රතාව උරුම වන රටාවක් ශ්‍රී ලංකාවේ දකින්න පුළුවන්. මොකද හේතුව, ඒ පවුල්වලට ස්වශක්තියෙන් දරිද්‍රතාවෙන් ගොඩඒමට හැකියාවක් නැතිකමයි. අඩු අධ්‍යාපන මට්ටම, දුර්වල සෞඛ්‍යය තත්ත්වය වගේ හේතූන් නිසා දරිද්‍රතාවෙන් ගොඩ ඒමට දෙමව්පියන්ට හැකියාවක් නැහැ. ඒ වගේම, ඒ පවුල්වල දරුවන්ටත් දෙමවුපියන්ගෙන් උරුම වන ඒ දරිද්‍රතාව චක්‍රයක් විදියට දිගින් දිගටම යනවා."

## 'දුගී බවට ලක්වෙලා සිටින ජනතාවගේ ආකල්පමය ගැටලු දරිද්‍රතාවට බලපානවා'



**ආචාර්ය සුරංග සිල්වා - ආර්ථික විද්‍යා අංශය, කොළඹ විශ්වවිද්‍යාලය**

"අපේ රටේ ඉතුරු කිරීම් අඩුයි. ඒ වගේම ආයෝජනයත් අඩුයි. මේක බහුප්‍රාංශික ක්‍රියාවලියක්. කිසිම අවස්ථාවක දුගී බවට හේතු අපට නිශ්චිතව කියන්න බැහැ. නමුත් ඇත්තටම දුගී බවට ප්‍රධානතම හේතුවක් විදියට දකින්නේ රජය මගින් ක්‍රියාත්මක කරන දුගී බව නැති කිරීමට ගන්නා ක්‍රියාමාර්ගවල අඩුපාඩුකම් වගේම, දුගී බවට ලක්වෙලා ඉන්න ජනතාවගේ ආකල්පමය ගැටලුයි."

## 'කෘෂිකර්මාන්තයම කේන්ද්‍ර කරගෙන දිළිඳුකම පිටු දැකිය නොහැකියි'



**මහාචාර්ය විමලරතන හිමි - අංශ ප්‍රධානී, ආර්ථික විද්‍යා අංශය, කොළඹ විශ්ව විද්‍යාලය**

"සිංහල රජ කාලේ වගේම, ඉතා පැරණි යුගවලත් මේ කෘෂිකර්මාන්තය කේන්ද්‍ර කරගෙන තමයි, දිළිඳුකම පිටු දැකීමට උත්සහා කළේ. අභාග්‍යයකට වගේ නිදහසේ ඉඳලා අද දක්වා අපේ ප්‍රධාන අවධානය යොමුවන්නේත්, මේ කෘෂිකර්මාන්තය නගා සිටුවීම තුළින්ම දරිද්‍රතාව පිටු දැකිය යුතුයි කියන කාරණයටයි. කෘෂිකර්මාන්තය ඕනෑවට වඩා අවධාරණය කරලා, ඒ තුළින්ම දරිද්‍රතාව පිටු දැකීමට උත්සාහ කරනවා කියන්නේ, අපි තව තවත් දරිද්‍රතාවේ පතුලට කිඳ බැසීමකුයි."

## 'ජීවත්වෙන ප්‍රදේශය දරිද්‍රතාව කෙරෙහි බලපානවා'



**මහාචාර්ය දිලිනි ගුණවර්ධන - ආර්ථික විද්‍යා අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

"දරිද්‍රතාවට බලපාන ප්‍රධාන සාධකය ලෙස කෙනෙක්ට ඔහුගේ අධ්‍යාපනය වැදගත් වෙනවා. ඔහුගේ ජීවනෝපාය වැදගත් වෙනවා. කෙනෙක් කෘෂිකර්මයේ යෙදෙනවාද, නැත්නම් කාර්මික අංශයේ වැඩ කරනවාද, නැත්නම් සේවා අංශයේ වැඩ කරනවාද කියන සාධක බලපානවා. ඇත්තටම මේ සාධක සියල්ලම සලකා බැලූවිට වඩාත්ම වැදගත් වෙන්නේ කෙනෙකුගේ පිහිටීමයි. ඒ කියන්නේ ශ්‍රී ලංකාවේ කවර ප්‍රදේශයේද ජීවත් වෙන්නේ කියන සාධකය තමයි, ඇත්තටම වැදගත් වෙන්නේ."

## 'මෙරට දිළිඳුකම කුඩා කණ්ඩායම්වල ඇති ගැටලුවක් ලෙස වටහාගත යුතුයි'



**මහාචාර්ය ටියුඩර් කාලිංග - ආර්ථික විද්‍යා අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

"ශ්‍රී ලංකාව ගත්තාම අපේ තියෙන ජාතික සංඛ්‍යාලේඛන අනුව පහුගිය අවුරුදු පහළොව, විස්සක විතර කාලය තුළ දිළිඳුකමේ ශීඝ්‍ර අඩුවීමක් පෙන්නුම් කරනවා. හැබැයි මේ සංඛ්‍යාලේඛනවලින් නියම වශයෙන්ම දිළිඳුකම පිළිබඳ රටේ තියෙන තත්ත්වය, හරියටම පැහැදිලි වෙන්නේ නැහැ. ඒකට හේතුව තමයි, විශේෂයෙන්ම ආදායම් වියදම් ගැන අපට ලැබිලා තියෙන තොරතුරුවල යම් යම් අඩුපාඩුකම් තියෙන්න පුළුවන්. ශ්‍රී ලංකාවේ මහා පරිමාණ දිළිඳුකමක් අපිට පේන්න නැහැ.

ශ්‍රී ලංකාවේ දිළිඳුකම දැකිය හැක්කේ ප්‍රධාන සමාජ ප්‍රවාහයන් තුළ තියෙන කුඩා කණ්ඩායම්වල පවතින ප්‍රශ්නයක් හැටියටයි. එහෙම නැත්නම්, Poverty pockets කියලා අපි ඒවාට කියනවා. දිළිඳු කොටු වගේ තත්ත්වයක් තමයි, දකින්න පුළුවන් වෙන්නේ. එතකොට ඒ දිළිඳු කොටු ගත්තාම, ඒවාගේ දිළිඳුකම තිබීමට විශේෂ හේතු තියෙනවා. එහිදී, මේ හේතු හඳුනාගැනීම අවශ්‍ය වෙනවා. ඒවාට කළ යුත්තේ කුමක්ද, විශේෂයෙන් බලසතුකරණය කිරීමට පුළුවන් කොහොමද, ඔවුන් ප්‍රධාන සමාජ ප්‍රවාහයට සම්බන්ධ කරන්නේ කොහොමද කියන එක මං හිතන්නේ ප්‍රතිපත්ති සම්පාදනයේදී වැඩි අවධානයකට ලක්විය යුතු කාරණාවක්."

## 'සමාජයේ තිබෙන බෙදීම් දරිද්‍රතාව කෙරෙහි බලපානවා'



**ආචාර්ය නාලිනි හෙන්නායක - භූගෝල විද්‍යා අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය**

"සමාජීය නිශේධනය